# පළමු පරිච්ඡේදය

## 1. හැඳින්වීම

### 1.1 පසුබිම

සංවර්ධන දර්ශකයන් පුළුල් පරාසයක් ඔස්සේ පැතිර ඇති මෙම කාල වකවානුව තුළ 2013/14 වර්ෂයන් කේන්ද්‍රකර ගනිමින් පළමුවරට ජාතික වැදගත්කමකින් යුතු ආර්ථික සංගණනයක් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මේ වන විට පවත්වා අවසන් කොට ඇත.

මෙම ආර්ථික සංගණනය, සාමාන්‍යයෙන් ජන හා නිවාස සංගණනයට අනතුරුව පැවැත්වෙන කෘෂිකර්ම සංගණනයත් කර්මාන්ත සංගණනයත් යන සංගණන දෙකෙහි එකතුවකි. ආර්ථිකයේ ප්‍රධාන අංශයන් වන කෘෂිකර්ම, කර්මාන්ත,වෙළෙඳ හා සේවා යන අංශ ආවරණය කරමින් පවත්වන ගණන් ගැනීමේ කටයුතුවලදී කෘෂිකර්ම අංශයේ තොරතුරු ලබා ගැනීම ප්‍රශ්නාවලීන් කිහිපයක් භාවිතා කරමින් වෙනම කොටසක් වශයෙන් සිදු කෙරිණි. ඒ අනුව ආර්ථික සංගණනය 2013/14,“කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම” සහ “කර්මාන්ත, වෙළෙඳ හා සේවා පිළිබඳ ගණන් ගැනීම” ලෙස කොටස් දෙකකින් යුක්තය.

### 1.2 සංගණන ඉතිහාසය

මෙතෙක් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම තොරතුරු රැස්කර ගැනීම සඳහා සංගණන විවිධ ස්වරූපයෙන් සිදු කර ඇත. 1921 දී පවත්වා ඇති නිෂ්පාදන සංගණනය කෘෂිකර්ම සංගණන ඉතිහාසයේ හමුවන පළමුවන ගණන් ගැනීමයි. අනතුරුව 1924 හා 1929 වර්ෂවලදී තවත් අර්ධ සංගණන දෙකක් පවත්වා ඇත. එකී සංගණනයන්හි විශේෂ ලක්ෂණයක් වූයේ වගා කළ ඉඩම් ප්‍රමාණය, සත්ව සංඛ්‍යාති, නිෂ්පාදන ප්‍රමාණය ගම් මට්ටමින් එක් රැස් කිරීමයි. එමෙන් ම 1946, 1952, 1962, 1973, 1982 සහ 2002 යන වර්ෂවලදී පූර්ණ කෘෂිකර්ම සංගණන පවත්වා ඇත. රටේ ඇතැම් ප්‍රදේශවල පැවති අයහපත් වාතාවරණය නිසා 1992 වර්ෂයේදී කෘෂිකර්ම සංගණනයක් පැවැත්වීමට නොහැකිවිය.

ජන සංගණනයක් පැවැත්වීමෙන් අනතුරුව එළඹෙන වර්ෂදෙකේදී කෘෂිකර්ම සංගණනයත් කර්මාන්ත සංගණනයත් පැවැත්වීම සාමාන්‍ය සම්ප්‍රදායවිය. ජන හා නිවාස සංගණනයේදී යොදාගන්නා රාමුවම භාවිතා කළ හැකි වීම නිසා වියදම අවම කර ගැනීමට ඇති හැකියාව ද සැලකිල්ලට ගෙන වසර 10කට වරක් මෙම සංගණන රටාව අනුගමනය කෙරුණි. කෙසේ වෙතත් මෑත කාලීන ආර්ථික ප්‍රවණතාවයන් ද සැලකිල්ලට ගනිමින් 2012 වසරේ පැවති ජන හා නිවාස සංගණනයෙන් අනතුරුව 2013/14 වර්ෂවලදී ආර්ථික සංගණනයේ එක් කොටසක් ලෙස කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම සිදු කරන ලදී. 2002 වර්ෂයේ පැවති අවසන් කෘෂිකර්ම සංගණනයෙන් පසුව වසර 12ක පමණ කාලයක් තුළ ශ්‍රීලංකාවේ ආර්ථිකයට කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් ලැබී ඇති දායකත්වය ඇගයීම සඳහා මෙම සංගණනය බෙහෙවින් ඉවහල් වනු ඇත.

## 1.3 අරමුණ

කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම ප්‍රධාන වශයෙන් පහත සඳහන් විෂයන්ට අදාල ප්‍රමාණාත්මක තොරතුරු රැස් කිරීම මූලික අරමුණු කොට ගනිමින් පවත්වනු ලැබිය.

I. ගොවි කාණ්ඩ
II. ගොවි කාරකයින්
III. ඉඩම් භාවිතය හා භුක්තිය
IV. බෝග වගාව
V. සත්ව පාලනය
VI. ජලජීවී වගාව
VII. පොහොර සහ පළිබෝධනාශක භාවිතය
VIII. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය හා අයිතිය

## 1.4 තොරතුරු රැස්කිරීමේ ක්‍රියා පිළිවෙල

කුඩා ගොවිකාණ්ඩ අංශය පිළිබඳ තොරතුරු ඒ සඳහා පිළියෙල කරන ලද ප්‍රශ්න මාලාවක් (SH 2) ඇසුරින් රැස්කරන ලදි. ජන හා නිවාස සංගණනයේදී සකස් කරන ලද නිවාස, සමූහ වාසස්ථාන, ආයතන, වාසය සඳහා නොවන ස්ථාන යන ඒකක කරා ගොස් ගණන්ගන්නා නිලධාරීන් ලෙස පත් කරන ලද කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ වෙනත් රජයේ නිලධාරීන් විසින් කුඩා ගොවිකාණ්ඩ අංශය පිළිබඳ තොරතුරු රැස්කිරීම සාර්ථකව සිදු කරන ලදී.

## 1.5 කෘෂිකාර්මික තොරතුරුවල ප්‍රයෝජන

ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමෙන් ලබාගන්නා වූ තොරතුරු ප්‍රධාන වශයෙන් පහත අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගනී.

I. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන ව්‍යුහාත්මක වෙනස්කම් පදනම් කරගෙන අනාගත කෘෂිකර්ම සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම
II. දේශීය නිෂ්පාදන ඉහළ නැංවීමෙහිලා කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන් පිළියෙළ කිරීම
III. ආයාත නිර්යාත ප්‍රතිපත්තිවලට අදාළ තීරණ ගැනීම
IV. ජාතික ගිණුම් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම
V. ඉදිරි කාලයේ පැවැත්වීමට අරමුණු කර ඇති කෘෂිකර්ම සමීක්ෂණ සඳහා නියැදි රාමුව සකසා ගැනීම

## 1.6 ගණන් ගැනීමේ අදියරයන්

කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම අදියර හතරකින් අවස්ථා තුනක දී සිදු වේ.

I. අක්කර 20 ක් හෝ ඊට වැඩි ගොවි කාණ්ඩ එනම් “වතු”ලැයිස්තුගත කිරීම

අකකර 20 ක් හෝ ඊට වැඩි ගොවි කාණ්ඩ “වතු” ලෙස හඳුනා ගන්නා අතර එම ගොවි කාණ්ඩ E1 උපලේඛනයෙහි ලැයිස්තුගත කරගනී.

II. අක්කර 20 ක් හෝ ඊට වැඩි ගොවි කාණ්ඩ තුළින් විස්තරාත්මක තොරතුරු ලබාගැනීම

සකස් කරගත් E1 උපලේඛනය අනුව සියලුම “වතු” වලින් E2 උපලේඛනය භාවිතයෙන් තොරතුරු රැස්කර ගනී.

III. අක්කර 20ට අඩු කුඩා ගොවි කාණ්ඩ අංශය ලැයිස්තුගත කිරීම

අක්කර 20ට අඩු සහ ඉදිරියේ දී විස්තර කෙරෙන පරිදි කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සිදු කරන ස්ථාන “කුඩා ගොවි කාණ්ඩ” ලෙස හඳුනාගෙන SH1 උපලේඛනයෙහි ලැයිස්තුගත කරගනී.

IV. කුඩා ගොවිකාණ්ඩ අංශයෙන් තොරතුරු ලබාගැනීම

සකස් කරගත් SH1උපලේඛනයෙන් සහ SH2උපලේඛනයෙන් “කුඩා ගොවිකාණ්ඩ” අංශයෙන් තොරතුරු රැස්කර ගනී.

## 1.7 මෙහි අඩංගු සංඛ්‍යාතීන්

මේ යටතේ 2014 වසරේ මුලතිව් දිස්ත්‍රික්කයේ, පර්චස් 40 ට වැඩි බිම් ප්‍රමාණයක් සහිත කුඩා ගොවිකාණ්ඩ හෝ නිෂ්පාදනයෙන් වැඩි කොටසක් විකිණීම සඳහා වූ කුඩා ගොවිකාණ්ඩ පිළිබඳ රැස් කරන ලද තොරතුරු වල සංඛ්‍යාතීන් අඩංගු වේ.

## 1.8 ආවරණය

මෙවර ආර්ථික සංගණනය යටතේ කුඩා ගොවිකාණ්ඩ අංශය පිළිබඳ තොරතුරු රැස් කිරීම දිස්ත්‍රික්ක 25 ත් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 331 ත් ඇතුලත්ව සමස්ත දිවයිනම ආවරණය වන පරිදි සිදුකරන ලදි.

**සැළකිය යුතුයි :**

**මෙම ප්‍රකාශනය පරිශීලනය කිරීමේදී ප්‍රධාන වශයෙන් මතක තබාගතයුතු කරුණ වන්නේ මෙහි අඩංගු සංඛ්‍යාතීන් ගොවිකාරකයා පදිංචි ස්ථාන පදනම්ව මිස එම ඉඩම් හෝ ගොවිකාණ්ඩවල පිහිටීම මත විග්‍රහ කරන ලද ඒවා නොවන බවයි.**